# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2281/21 – 2022 මැයි 25 වැනි බදාදා – 2022.05.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2018/175.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2022.01.04 දිනැති හා අංක 2261/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.12.16 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් බදුල්ල, කුට්ටියගොල්ල, නාගොල්ල, නිල්මිණි නිවස හි පදිංචි ඩබ්. ඒ. විජේදාස මයා. සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.04.01 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 අප්‍රේල් මස 29 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය: IR/COM/05/2018/175.

**කොළඹ කාර්මික අධිකරණයේ දී ය.**

1. ඩබ්. ඒ. විජේදාස මහතා
   නිල්මිණි නිවස,
   නාගොල්ල,
   කුට්ටියගොල්ල,
   බදුල්ල.

*පළමු පාර්ශවය*

එදිරිව


1A – G 36812 – 11(2022/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශවය*

අතර පවතින කාර්මික ආරාවුල

## ප්‍රදානය

කම්කරු අමාත්‍ය, නීතිඥ ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් (පා.ම.) විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් කම්කරු අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා අංක IR/COM/05/2018/175 හා 2021.12.16 වැනි දින දරන නියෝගයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

බේරුම්කරණය සඳහා මා වෙත යොමුකර ඇති උක්ත නියෝගය ප්‍රකාරව පහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගතවී ඇති කාර්මික ආරාවුලයි.

1. ඩබ්. ඒ. විජේදාස මහතා
නිල්මිණී නිවස,
නාගොල්ල,
කුට්ටියගොල්ල,
බදුල්ල.

*පළමු පාර්ශවය*

නඩු අංකය: A 77/2021

2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශවය*

මෙම ආරාවුලට හේතු වී ඇති කාරණය ලෙස කම්කරු කොමසාරිස් ජනරාල් නීතිඥ බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා විසින් 2021.12.16 වන දින ලිපියේ සඳහන් කර ඇත්තේ ''වයස අවුරුදු 57 සම්පූර්ණවීම මත 2013.10.05 දිනැතිව විශ්‍රාමගන්වා ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කළ ඩබ්. ඒ. විජේදාස මහතා 2015.04.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත සේවයේ පිහිටවූවද, 2013.10.05 වන දින සිට 2015.04.24 දක්වා කාලයට වැටුප් නොගෙවීමෙන් ඒ මහතාට අසාධාරණයක් සිදු වී තිබේද? අසාධාරණයක් සිදුවී ඇත්නම් කුමන සහන හිමිවිය යුතුද? යන්න පිළිබඳ වේ.''

**බේරුම්කරණ විභාගයේ පසුබිම හා එය පැවැත්වූ ආකාරය -**

මෙම කාර්මික ආරවුල සම්බන්ධයෙන් කම්කරු හා වෘත්තීය සමිති සම්බන්ධතා අමාත්‍ය ගරු රවීන්ද්‍ර සමරවීර මහතා විසින් අංක IR/COM/05/2018/175 හා 2019.10.07 දින දරන ලිපියෙන් එම්. ඊ. ජී. සමරවීර මහතා පත්කර ඇති අතර ඒ මහතා විසින් 2021 මාර්තු 20 වන දින දක්වා මෙම බේරුම්කරණය පිළිබඳ කටයුතු පවත්වාගෙන ගොස් ඇත.

එමෙන්ම කම්කරු අමාත්‍ය නීතිඥ ගරු නිමල් සිරිපාල ද සිල්වා (පා.ම.) මැතිතුමා විසින් IR/COM/05/2018/175 හා 2021 මාර්තු 30 වන දින සිට මෙම ආරවුල බේරුම්කරණය සඳහා පන්වත්තේගෙදර සරත් ප්‍රේමලාල් මහතා පත්කර ඇති අතර ඒ මහතා විසින් එම කටයුත්ත 2021.12.16 වන දින දක්වා පවත්වාගෙන ගොස් ඇත.

එබැවින් මෙම කාර්මික ආරවුල A/105/2019 හා A/38/2021 යටතේ විභාග වූ බැවින් ද එම නඩු එකම කාර්මික ආරවුලකට හේතු වූ බැවින් ද දැනට මෙම නඩු කටයුතු සඳහා අවුරුදු 3 ක් පමණ කල් ගත වී ඇතත්, බේරුම්කරණය වී නොමැති හෙයින් ද ඉල්ලුම්කරු හා වගඋත්තරකරුවන්ගේ එකඟතාවයෙන් මෙම නඩු දෙකටම අදාළ විභාග සටහන් හා ලිඛිත ප්‍රකාශ, එම නඩුවලට ඉදිරිපත් කරන ලද, ලකුණු කරන ලද ලේඛන අංක A/77/2021 නඩුවට අදාළ වන හෙයින් ඒ අනුව බේරුම්කරණ ඉදිරියටත් පවත්වාගෙන යාමට මා විසින් කටයුතු කරන ලදී.

පහත සඳහන් දිනයන් යටතේ නඩු කැඳවීමට කටයුතු කර ඇත -

| *නඩු අංකය* | *දිනයන්* | |
|---|---|---|
| A/38/2021 | 2021.05.05 | |
| | 2021.06.28 | |

| *නඩු අංකය* | *දිනයන්* | |
|---|---|---|
| A/77/2021 | 2022.01.10 | |
| | 2022.01.19 | |
| | 2022.01.25 | |
| | 2022.02.09 | |
| | 2022.03.02 | |
| | 2022.03.14 | |
| | 2022.03.22 | නඩුව අවසන් කර ඇත. |

මෙම නඩුවේ ඉල්ලුම්කරු වන ඩබ්. ඒ. විජේදාස මහතා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ xi ශ්‍රේණියේ බස් රියදුරෙකු වශයෙන් 1980.03.03 වන දින සිට සේවයට බඳවාගෙන ඇත. ඉන් පසු 2003.12.01 වන දින සිට vi A ශ්‍රේණියේ රියදුරු පරීක්ෂක තනතුරේ 2003.12.01 වන දින සිට බලපවත්වන පරිදි ස්ථිර කර ඇත. ඔහු රියදුරු පරීක්ෂක (vi ශ්‍රේණියේ) වශයෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කැප්පෙටිපොල ඩිපෝවේ සේවය කරමින් සිටින විට, එම ඩිපෝවේ ඩිපෝ කළමනාකරු විසින් ඔහුගේ අංක ශ්‍රීලංගම/කැපො/ඩික/විශ්‍රාම/013/2013 හා 2013 ඔක්තෝබර් මස 01 වන දින ලිපියෙන් ''2013.10.06 වන දිනට ඩබ්. ඒ. විජේදාස මහතාට වයස අවුරුදු 57 සම්පූර්ණ වන බැවින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මානව සම්පත් කළමණාකාර තැනගේ අංක ශ්‍රීලංගම/මාසක/චලේ/52/2011 හා 2011 දෙසැම්බර් 12 දාතමින් නිකුත් කර ඇති 2011 අංක 15 දරන ශ්‍රීලංගම මානව සම්පත් කොට්ඨාස චක්‍රලේඛ අනුව 2013 ඔක්තෝබර් මස 05 දින සේවය නිමවීමෙන් පසු ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කැප්පෙටිපොල ඩිපෝවේ vi - A ශ්‍රේණියේ රියදුරු පරීක්ෂක තනතුරේ සේවයෙන් විශ්‍රාම ගන්වමි'' (A 02 ලිපිය) යනුවෙන් විශ්‍රාම ගන්වා ඇති බවයි.

මෙසේ විශ්‍රාම ගැනීමෙන් පසු නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කරන ලෙසට හපුතලේ කම්කරු කාර්යාලයේ කම්කරු කොමසාරිස් වෙත 2014.01.07 වන දින දාතමින් ඉල්ලීමක් කර ඇත. (A 04 ලිපිය) ඉන් පසු ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන මානව සම්පත් කළමනාකාර විසින් ඔහුගේ අංක ශ්‍රීලංගම/මාසක/ප්‍රති/2015 හා 2015.04.23 දරන ලිපියෙන් ඩබ්. ඒ. විජේදාස මහතාට දන්වා ඇත්තේ එහි අංක 01 පරිදි ''ඒ අනුව මේවනවිට ඔබ වෙත නිකුත් කර ඇති විශ්‍රාම ගැන්වීමේ ලිපිය මෙයින් බලරහිත කරමින් 2015 අංක 01 දරන ශ්‍රී ලංකා මානව සම්පත් කළමනාකරණ කොට්ඨාස චක්‍රලේඛයේ සඳහන් කොන්දේසිවලට යටත්ව, හිඟ වැටුප් රහිතව 2013.10.05 වන දින සිට සේවය ප්‍රතිෂ්ඨාපනය කරමි.'' යනුවෙනි.

ඉහත ලිපිය අනුව ගම්‍ය වන්නේ ඩබ්. ඒ. විජේදාස මහතා නැවත සේවයේ පිහිටුවීමට කාලයක් ගත වී ඇති බවයි. (එනම් 2013.10.06 වන දින සිට 2015.04.23 දක්වා) මේ සම්බන්ධයෙන් 2022.01.10 වන දින කාර්මික අධිකරණයේ පැවති නඩු විභාගයේ දී වගඋත්තරකාර පාර්ශවයෙන් ගරු අධිකරණය ප්‍රශ්නකළ විට ලද පිළිතුරු පහතින් උපුටා දක්වමි.

ප්‍ර : මොහු විශ්‍රාම ගියේ කවදාද?
පි : 2013 ඔක්තෝබර් මස 06 වන දින බව වගඋත්තරකාර පාර්ශවය කියා සිටී.
ප්‍ර : මොහු විශ්‍රාම ගියේ 2013, නැවත සේවයේ පිහිටුවන්න සැහෙන්න කාලයක් ගතවී තිබෙනවා.
පි : එතකොට ඒ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අදාළ කර ගත්තේ පසුව,
ප්‍ර : ඇයි කාගෙද වරද? විජේදාස මහතාගෙද?
පි : නෑ ස්වාමීනි, ඇත්තටම අපේ ආයතනයේ ලොකු ප්‍රශ්න තිබුනා.
ප්‍ර : කෝ ඒ චක්‍රලේඛය?
පි : එය මට ගෙන්වා ගැනීමට බැරි වුණා. ස්වාමීනි, ඒ ෆයිල් එක ගැන සම්පූර්ණ දැනුම තියෙන්නේ කැප්පෙටිපොල ඩිපෝවේ අයට. නමුත් ස්වාමීනි, මොහු විශ්‍රාම ගැන්වීම වැරදි නම් කම්කරු විනිශ්චය සභාවක ගිහිල්ලා අර අනිත් සේවකයන්ට වගේ පසු වැටුප් එක්ක රැකියාව ගන්න තිබ්බා. නමුත් ස්වාමීනි, ඔහු එහෙම කළේ නෑ. පසු වැටුප් රහිතව එකගවෙලා පත්වීම් ලිපිය අත්සන් කරලා ඒ අයිතිවාසිකම් අත්හැරලා රස්සාවට ඇවිල්ලා තියෙන්නේ.
ප්‍ර : 2013 විශ්‍රාම ගිය කෙනා 2015 වෙනකල් ගියේ මෙයාගේ වරදක්ද? කාගේ වරදක්ද?
පි : ආයතනයේ ප්‍රශ්නයක් තමයි ස්වාමීනි. නමුත් ඒක ඉල්ලුම්කාරයා සම්බන්ධයෙන් අසාධාරණයක් නෙමෙයි. පොදුවේ 57 න් විශ්‍රාම ගිය හැමෝටම වුන දෙයක් ස්වාමීනි.
ප්‍ර : ප්‍රමාද දෝෂය වෙලා තියෙන්නේ ලංකා ගමනාගමන මණ්ඩලයෙන් බව පිළිගන්නවද?
පි : එය පිළිගන්නවා ස්වාමීනි. නමුත් ඒකට සාධාරණ හේතු තියෙනවා.

අධිකරණය -

ඩබ්. ඒ. විජේදාස මහතා නැවත සේවයේ පිහිටුවීම ප්‍රමාද වූයේ ගමනාගමන මණ්ඩලයේ ප්‍රමාද දෝෂයකින් බව වගඋත්තරකරුගේ නීතිඥ පිළිගනී.

පළමු පාර්ශවයේ මූලික තර්කය වූයේ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2013 හා 2013.01.15 දින දරන රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයන් විශ්‍රාම ගැනීමේ වයස සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සන්දේශ අංක 12/1760/504/158 අනුව පහත සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ඒ අනුව 2013.01.01 දින සිට එම විධිවිධාන ක්‍රියාත්මක වේ යනුවෙන් එහි,

1. ''පරිදි රාජ්‍ය ව්‍යවසායන් හි සේවකයන්ගේ වෛකල්පිත විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 55 ක්වන අතර කිසියම් නිලධාරියෙකු වයස අවුරුදු 55 ඉක්මවා සේවයේ යෙදීමට අදහස් කරන්නේ නම් සේවා දීර්ඝ කිරීමේ ඉල්ලීමක් නොමැතිව අවුරුදු 60 දක්වා සේවයේ යෙදී සිටිය හැකිය.''

එහෙත් එම රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2013 ට පටහැනිව ඩබ්. ඒ. විජේදාස මහතා විශ්‍රාම ගන්වා ඇති බව නඩු විභාගයේ දී අනාවරණය විය.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නියෝජ්‍ය මානව සම්පත් කළමනාකරු පැමිණිලි පාර්ශවයේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු සපයමින්,

ප්‍ර : ඒ අනුව 1/2013 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා ඊට අනුගතව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය නිකුත් කළ 2013 අංක 03 යන චක්‍රලේඛ දෙකටම පටහැනිව වයස අවුරුදු 57 න් 2013.10.05 වන දින සිට මෙම ඉල්ලුම්කරු විශ්‍රාම ගන්වා ඇති බව පිළිගන්නවද?
පි : පිළිගන්නවා.
ප්‍ර : 2013.10.05 පසු ඉල්ලුම්කරුට රැකියාව අඛණ්ඩව කරගෙන යාමට නොහැකි වීමට බලපා ඇත්තේ ඒ හේතුව කිව්වොත් පිළිගන්නවාද?
පි : පිළිගන්නවා. (සාක්ෂිකරුට A 05 ලේඛනය පෙන්වා දෙයි)
ප්‍ර : ඉල්ලුම්කරු සේවයේ ප්‍රතිෂ්ඨාපනය කළේ මේ A 05 අනුව කවදා සිටද?
පි : 2015 අප්‍රේල් 23
ප්‍ර : කවදා සිට ක්‍රියාත්මක වන පරිදි ද සේවයේ ප්‍රතිෂ්ඨාපනය කර තිබෙන්නේ.
පි : 2013.10.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි
ප්‍ර : නමුත් ඔහුට හිඟ වැටුප් ගෙවලා නැහැ.
පි : ගෙවලා නැහැ.

අධිකරණය -

ප්‍ර : දැන් එම ප්‍රමාද දෝෂය සිද්ධවුනේ ගමනාගමන මණ්ඩලයෙන්ද? විජේදාස මහතාගේ වරදින්ද?
පි : ගමනාගමන මණ්ඩලයෙන්
ප්‍ර : ඒක පිළිගන්නවාද?
පි : පිළිගන්නවා

සාක්ෂි විශ්ලේෂණය හා නිගමනය -

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරු පරීක්ෂක ඩබ්. ඒ. විජේදාස මහතා වයස අවුරුදු 57 සම්පූර්ණවීම මත 2013.10.05 දින සිට විශ්‍රාම ගැන්වීම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් සිදු කර ඇත.

මෙම විශ්‍රාම ගැන්වීම: පළමු පාර්ශවය විසින් සිය පැමිණිල්ලෙන් කියා සිටියේ මහා භාණ්ඩාගාරයේ ලේකම්ගේ 2013.01.15 දින දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2013 ට පටහැනි බවයි.

මෙම චක්‍රලේඛය අනුව -

(i) රාජ්‍ය ව්‍යවසායන සේවකයන්ගේ වෛකල්පිත විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 55 ක් වන අතර කිසියම් නිලධාරියෙකු වයස අවුරුදු 55 ඉක්මවා සේවයේ යෙදීමට අදහස් කරන්නේ නම් සේවා දීර්ඝ කිරීමේ ඉල්ලීමක් නොමැතිව අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස වන අවුරුදු 60 දක්වා සේවයේ රැඳී සිටීමට හැකිය.
(ii) අවුරුදු 55 සිට 60 දක්වා කාල පරිච්ඡේදය තුළ නිලධාරියාගේ අභිමතය පරිදි පත්වීම් බලධාරියා වෙත මාස 03 ක පූර්ව දැනුම්දීමක් කිරීමෙන් අනතුරුව විශ්‍රාම යා හැකිය.

(iii) කාර්යක්ෂමතාව හා කාර්ය සාධනය සතුටුදායක නොවන නිලධාරියෙකුට වයස අවු. 55 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීමක් ලබා නොදීමට පත්වීම් බලධාරියා තීරණය කරන්නේ නම්, එයට එරෙහිව නිලධාරියාට අභියාචනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් සැළසෙන ආකාරයෙන් මාස 6 ක පූර්ව දැනුම්දීමකින් පසුව විශ්‍රාම ගැන්වීමේ බලය පත්වීම් බලධාරියා සතු වේ.

(iv) රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයින්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස සම්බන්ධව මීට පෙර නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 60 මෙයින් අවලංගු වේ.

ඉහත චක්‍රලේඛය අනුව, රියදුරු පරීක්ෂක ඩබ්. ඒ. විජේදාස මහතාට කිසිදු ඉල්ලීමක් නොමැතිව බාධාවකින් තොරව වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට කිසිදු බාධාවක් තිබිය නොහැක.

මෙය වඩාත් තහවුරු කරන්නේ රියදුරු පරීක්ෂක ඩබ්. ඒ. විජේදාස මහතා අවුරුදු 1, මාස 06, දින 18 කට පසුව නැවත සේවයේ ප්‍රතිෂ්ඨාපනය කිරීම තුළිනි.

මේ බව පැහැදිලිවම නඩු විභාග දිනයන්හි දී නියෝජ්‍ය මානව සම්පත් කළමනාකරුගෙන් ඉල්ලුම්කරුගේ නියෝජිතයාගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, නියෝජ්‍ය මානව සම්පත් කළමනාකරුගෙන් අසන ලද හරස් ප්‍රශ්නවලට ලද පිළිතුරෙන් සනාථ වේ.

ප්‍ර : ඒ අනුව 1/2013 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ හා ඊට අනුගතව ශ්‍රීලංගම නිකුත් කළ 2003 අංක 03 යන චක්‍රලේඛ දෙකටම පටහැනිව ඩබ්. ඒ. විජේදාස මහතා වයස අවු. 57 න් 2013.10.05 වැනි දින සිට මෙම ඉල්ලුම්කරු විශ්‍රාම යවා ඇති බව පිළිගන්නවාද?

පි : පිළිගන්නවා.

ප්‍ර : 2013.10.05 න් පසු ඉල්ලුම්කරුට රැකියාව අඛණ්ඩව කරගෙන යාමට නොහැකිවීමට බලපා ඇත්තේ ඒ හේතුව කිව්වොත් පිළිගන්නවාද?

පි : පිළිගන්නවා.

ප්‍රදානය අදාළ කිරීම -

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් 1980.04.05 දාතමින් අංක සේක/105/ඌව/17 ලිපියෙන් ඩබ්. ඒ. විජේදාස මහතා xi වන ශ්‍රේණියේ බස්රථ රියදුරු තනතුරකට පත්කර ඇත. (R 02 ලිපිය)
2. සේවක මණ්ඩල කළමනාකරු, සී/ස ඌව බස් සමාගම විසින් අංක ඌබස/සේමකො/203/4-29 හා 2003.11.25 දරන ලිපියෙන් ඩබ්. ඒ. විජේදාස මහතාගෙන් රියදුරු පරීක්ෂක ආවරණ පත්වීම ස්ථිර කර ඇත.
3. භාණ්ඩාගාර ලේකම්ගේ අංක PED/ප්‍රති/1/චක්‍රලේඛ හා 2011.04.29 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 60 (R 04 ලිපිය)
4. 2011 අංක 15 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති විසින් නිකුත් කළ 2011.12.13 දින දරන චක්‍රලේඛය (R 05 ලිපිය)
5. කැප්පෙටිපොල ඩිපෝ ධාවන කළමනාකරු විසින් 2013 ජූලි මස 29 වන දින දරන ඩබ්. ඒ. විජේදාස මහතාට විශ්‍රාම පූර්ව නිවාඩු ලබාගන්නා ලෙසට කළ දැනුම්දීම. (R 06 ලිපිය)
6. 2013 අංක 03 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මානව සම්පත් කළමනාකරණ කොට්ඨාස චක්‍රලේඛය (R 07 ලිපිය)
7. 2015 අංක 01 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මානව සම්පත් කළමනාකරණ කොට්ඨාස චක්‍රලේඛය (R 08 ලිපිය)
8. 2015 අංක 01 චක්‍රලේඛය අනුව ඩබ්. ඒ. විජේදාස මහතා සේවයේ ප්‍රතිෂ්ඨාපනය කිරීමේ 2015.04.23 දරන ලිපිය (R 09 ලිපිය)
9. ඩිපෝ කළමනාකරු කැප්පෙටිපොල විසින් 2016.09.15 වැනි දින ඩබ්. ඒ. විජේදාස මහතාට නිකුත් කළ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ ලිපිය (R 10 ලිපිය)
10. 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත (R 11 ලිපිය)
11. භාණ්ඩාගාර ලේකම් විසින් අංක PED/චක්‍රලේඛ/2013 හා 2013.01.15 දින දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2013 (පැ 03 ලිපිය)
12. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ (R 16 ලිපිය)
13. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කැප්පෙටිපොල ඩිපෝවේ කළමනාකරු විසින් ඔහුගේ අංක ශ්‍රීලංගම/කැපො/ඩික/විශ්‍රාම/013/2013 හා 2013.10.10 දින දරන ලිපිය (A 02 ලිපිය)
14. 2014.01.17 දාතමින් ඩබ්. ඒ. විජේදාස මහතා විසින් හපුතලේ කම්කරු කාර්යාලයේ කම්කරු කොමසාරිස් අමතන ලද ලිපිය (A 04 ලිපිය)
15. ඩබ්. ඒ. විජේදාස මහතා නැවත සේවයේ ප්‍රතිෂ්ඨාපනය කළ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන මානව සම්පත් කළමනාකාර තැනගේ 2015.04.23 ලිපිය (A 05 ලිපිය).

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයෙකු වූ ඩබ්. ඒ. විජේදාස මහතා එම මණ්ඩලයේ සේවයෙන් අවුරුදු 57 න් විශ්‍රාම ගන්වා ඇති බව වගඋත්තරකාර පාර්ශ්වය ද පිළිගෙන ඇත. මේ අනුව 2003.01.01 වන දින සිට ක්‍රියාත්මක වූ 01/2013 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව ඉහත විශ්‍රාම ගැන්වීම නීත්‍යානුකූල නොවන බව සඳහන් කරමි.

මෙම 01/2013 චක්‍රලේඛයට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට කිසිදු අභියෝගයක් නොකළ හැකි අතර, එහි සංශෝධනයක් ද සිදුකළ නොහැක. එම ලිපියෙන් අමාත්‍යාංශ ලේකම්වරු ඇතුළු ආයතන ප්‍රධානීන් දැනුවත්කර ඇත්තේ අදාළ ප්‍රතිපාදන 2013.01.01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කිරීමටයි. අදාළ ප්‍රතිපාදන පිළිබඳව යම් පැහැදිළිකර ගැනීමක් අවශ්‍ය නම් ඒ සම්බන්ධව දුරකථනයෙන් විමසීම් කරන ලෙසට උක්ත චක්‍රලේඛයේ අවසානයට සඳහන් කර ඇත.

මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති විසින් රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂක විමසා ඇති අතර එයට ලැබී ඇති පිළිතුරු ලිපිය (R 16 ලිපිය) වශයෙන් සඳහන් කරන අතර එය සිදුකර ඇත්තේ පැහැදිළි කිරීමක් වන අතර අදාළ චක්‍රලේඛය කිසිදු වෙනසක් කර නොමැති බව සඳහන් කරමි.

එහෙත් මෙම චක්‍රලේඛයේ ප්‍රතිපාදන තේරුම් ගැනීමට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අවුරුදු 1, මාස 06, දින 18 ක් ගත වූ අතර එම ප්‍රමාද දෝෂයන්ගේ වගකීම වගඋත්තරකාර පාර්ශවයේ නීතිඥවරිය විසින් කාර්මික අධිකරණයේ දී පිළිගෙන ඇත.

ඒ අනුව ඩබ්. ඒ. විජේදාස මහතා නැවත සේවයේ ප්‍රතිෂ්ඨාපනය කරමින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගින් නිකුත් කරනු ලබන (R 09 ලිපිය) ලිපිය මගින් 2015.01.05 වන දින 2015 අංක 01 චක්‍රලේඛය ගැන සඳහන් කරමින් 2013.10.05 වන දින සිට 2015.10.05 වන දින දක්වා හිඟ වැටුප් රහිතව සේවයේ පිහිටුවීම මෙයට පෙර සඳහන් කළ කරුණු අනුව යුක්තිසහගත හෝ සාධාරණ නිගමනයක් නොවන බව සඳහන් කරමි. තව ද, මෙම කොන්දේසිය 01/2013 චක්‍රලේඛය උල්ලංඝනය කිරීමකි.

එමෙන්ම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මානම සම්පත් කළමනාකරණ කොට්ඨාසයේ 2015 අංක 01 චක්‍රලේඛයේ 03 වගන්තිය අදාළ කරමින් ඩබ්. ඒ. විජේදාස මහතා සේවයේ ප්‍රතිෂ්ඨාපනය කළ යුතුය යන්න එම ලිපියට ආදේශ කර ගත්ත ද එය නිවැරදි නොවන්නේ ඔහු විශ්‍රාම ගිය අයෙකු නොව අදාළ ප්‍රමාදය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ක්‍රියාවලිය තුළ සිදු වූ ක්‍රියාකාරකම් බැවිනි. 2013.10.05 දින වන විට ඩබ්. ඒ. විජේදාස මහතාට 01/2013 චක්‍රලේඛයෙන් වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට ඔහුට ප්‍රතිපාදන හිමි වී තිබුණු බැවිනි.

මේ අනුව ඩබ්. ඒ. විජේදාස මහතා විශ්‍රාම ගැන්වීම නීත්‍යානුකූලව සිදු නොවූ බවට නිගමනය කරමි. එමෙන්ම මෙම අවස්ථාව අහිමි කිරීමේ ප්‍රමාදය හා එහි වගකීම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය පිළිගෙන ඇති බැවින් ද, 2013.10.06 වැනි දින සිට 2015.10.05 වැනි දින දක්වා ඒ මහතා අවසන්වරට ලබාගත් මාසික වැටුප හා දීමනාව වන රු. 27,280.00 මුදල අනුව ගණනය කර එය වන්දියක් වශයෙන් ඩබ්. ඒ. විජේදාස මහතාට ගෙවීමට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට මෙයින් නියෝග කරමි.

වන්දි ගෙවීම පහත ආකාරයට අර්ථකථනය කරනු ලැබේ.

මගේ අංක ශ්‍රීලංගම/කැපො/ගිණුම්/50/2015 හා 2015.04.24 දාතමින් සහකාර කළමනාකාර මුදල් යන අයගේ (A 01 ලිපිය) අනුව අවසන් වරට ලද වැටුප රු. 27,280.00 ක් වේ. එම මාසික වැටුප අවුරුදු 01, මාස 06, දින 18 ක් සඳහා ගෙවීම.

| | | | | | |
|---|---|---|---|---|---|
| මාසික වැටුප | රු. 27280.00 | x | මාස 18 | = | රු. 491,040.00 |
| දිනකට | රු. 909.33 බැගින් | x | දින 18 | = | රු. 16,367.94 |
| ගෙවිය යුතු සම්පූර්ණ මුදල | | | | = | රු. 5,07,407.94 (පන් ලක්ෂ හත්දහස් හාරසිය හතයි ශත අනූ හතරයි) |

ඉල්ලුම්කරු වන ඩබ්. ඒ. විජේදාස මහතා 2015.10.05 වන දින සිට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවයේ ප්‍රතිෂ්ඨාපනය කළ නිසා ඉල්ලුම්කරුගෙන් ආයතනයට යම් මුදල් අයකර ගැනීමට තිබුනේ නම් ඒ මුදල් අයකර ගැනීමට වගඋත්තරකාර ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අවස්ථාව තිබූ බව සඳහන් කරමි.

## නිගමන

ඉල්ලුම්කරු වන ඩබ්. ඒ. විජේදාස මහතා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙන් 2016.10.05 වන දින සිට විශ්‍රාම ලබා දැනට අවුරුදු 06 ක් පමණ ගත වී ඇත. මෙම කාර්මික අධිකරණයේ වසර 03 ක් පමණ නඩුවක් පවත්වාගෙන යනු ලබන අතර මෙම බේරුම්කරණ විභාගයේ දී ලිඛිත සැළකිරීම් හා කාර්ය සටහන්වල ඇතුළත් දෙපාර්ශවය විසින්ම මෙහෙයවන ලද සාක්ෂි, විභාග පටිපාටිය ඇතුළත් වරින්වර ඉදිරිපත් කරන ලද මූලික විරෝධතා හා ඒවා සම්බන්ධයෙන් දෙපාර්ශවයම තර්ක කරමින් ඉදිරිපත් කළ ලිඛිත සැළකිරීම් සහ ඒවා පිළිබඳ දෙනු ලබන තීරණයක්, දෙපාර්ශවයටම අවසන් ලිඛිත සැළකිරීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙමින් ඉදිරිපත් කළ කරුණු මා විසින් පරිශීලනය කරන ලදී. එමෙන්ම අවසන්වරට පරීක්ෂණ පැවැත්වූ මා විනිශ්චය අධිකාරියක් වශයෙන් නිරීක්ෂණය කළ කරුණු සමග ඒ සියල්ල සළකා බලමින් මෙම කාර්මික ආරවුලට අදාළ වූ සියලු කරුණුවල සමස්ථභාවය, මෙම ප්‍රදානය සකස් කිරීමේ දී මා පදනම් කරගත් බව සඳහන් කරමි. මෙම සියලු කරුණු මැදහත්ව සැළකීමෙන් පසු මෙම නඩුවේ ඉල්ලුම්කරු වන ඩබ්. ඒ. විජේදාස මහතා 2013.10.05 වන දින අවුරුදු 57 න් විශ්‍රාම ගැනීම නිසාත්, නැවත 2015.10.05 දින සිට නැවත සේවයේ ප්‍රතිෂ්ඨාපනය කිරීම නිසාත්, ඔහුට අවුරුදු 1, මාස 06, දින 18 ක සේවය තුළින් ලබා ගැනීමට තිබූ වැටුප් හා වෙනත් දීමනා, වරප්‍රසාද අහිමි කිරීම සිදුවූයේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 01/2013 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ කරුණු නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම තුළින් බව

තහවුරු විය. මෙම බේරුම්කරණ විභාගයේ දී විශේෂ ස්වරූපයක් දක්නට ලැබුණි. එනම් ආයතන නීතිරීති, රාජ්‍ය චක්‍රලේඛන කලට වේලාවට ක්‍රියාත්මක නොකිරීමත්, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට යම් සේවාවක් කළ සේවකයන්ට තම හිඟ වැටුප් පිළිබඳව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට සිදුවීම තුළින් ආයතනයේ මානව සම්පත් කළමනාකරණ කොට්ඨාසය මේ සම්බන්ධයෙන් අවධානය යොමුකර ප්‍රතිසංවිධානය විය යුතු බව සඳහන් කරමි. මෙම ප්‍රදානය කරනු ලබන්නේ ඉහත නිරීක්ෂණ හා නිගමන සැළකිල්ලට ගැනීමෙන් පසු එක් පසෙකින් නීතිය ද, අනෙක් පසින් යුක්තිය හා සාධාරණත්වය පදනම් කරගෙන බැව් අවධාරණය කරමි.

**ප්‍රදානය**

මේ අනුව මෙම නඩුවේ ඉල්ලුම්කරු වන ඩබ්. ඒ. විජේදාස මහතාට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ඔහු විශ්‍රාම ගැන්වීම කළ 2013.10.05 වන දින සිට 2015.10.05 දක්වා වූ කාලසීමාව වන අවු. 01, මාස 06, දින 18 ක් සඳහා ඔහුට හිමි වන්දි මුදල වන රු. 507407.94 (පන් ලක්ෂ හත්දහස් හාරසිය හතයි ශත අනූ හතරයි) මුදල සහ ඔහුගේ නඩු ගාස්තු ගෙවීමට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට මෙයින් නියෝග කරමි. තව ද, මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළවූ දින සිට මාස 02 ක් ඇතුළත අදාළ මුදල් හපුතලේ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතු බවට ද මෙයින් නියම කරමි.

ඉහත සඳහන් ප්‍රදානය කිරීම යුක්ති සහගත හා සාධාරණ බව ද ප්‍රකාශ කරමි.

ඒ. බී. හේරත්,
බේරුම්කරු.

2022 අප්‍රේල් මස 01 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

EOG 05 – 0115

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.